# ගම්පොළ නියම්ගම්පාය විහාරස්ථානයේ ගල්කැටයම්වලින් නිරූපිත සංගීත භාණ්ඩ ව්‍යුහකරණය පිළිබඳ අධ්‍යයනයක්

කේ. අශිනි චමෝදිනී [1]

ප්‍රමුඛ පදඃ නියම්ගම්පාය, ගල් කැටයම්, සංගීත භාණ්ඩ, භාණ්ඩ වර්ගීකරණය

## හැඳින්වීම

ශ්‍රී ලංකා රාජ්‍ය පාලන ඉතිහාසයේ ක්‍රි.ව. 1341 දී ගම්පොළ යුගය ආරම්භ විය. අනුරාධපුර යුගයෙහි ඉදිකළා යැයි සැළකෙන ශතවර්ෂ ගණනාවක අඛණ්ඩ ඉතිහාසයක් ඇති නියම්ගම්පාය විහාරස්ථානය ගඟසිරිපුර පුරවරයේ ප්‍රෞඪත්වය විදහාපාන කැඩපතක් බඳුය. වරින් වර ප්‍රතිසංස්කරණයට ලක් වූ දේශීය, විදේශීය සංකලනයෙන් යුත් අලංකාර ප්‍රතිනිර්මාණයක් ලෙස හැඳින්වේ. මෙම නියම්ගම්පාය විහාරස්ථානයෙහි ශෛලමය පාදමෙහි නිරූපණය වන්නේ කුමන වර්ගයේ සංගීත භාණ්ඩ ද? යන්න මෙහි පර්යේෂණ ගැටළුව වේ. මෙහිදී ගම්පොළ යුගයේ ගල් කැටයම් වල මූලික ලක්ෂණ හඳුනාගැනීම හා ඒවායෙන් සංගීත විශයට ඇති සම්බන්ධතාවය සෙවීම, පාදමෙහි නිරූපිත ගල් කැටයම් මිනුම්ගත කිරීම මඟින් සාපේක්ෂව සංගීත භාණ්ඩ හඳුනා ගැනීම යනාදිය අරමුණු ලෙස දැක්විය හැකිය.

## පර්යේෂණ ක්‍රමවේදය

සංගීත රූපාකෘතිවේදය හා සම්බන්ධව මෙම පර්යේෂණය සිදු කෙරේ. මේ හා සම්බන්ධ පර්යේෂණ බොහෝ දුරට සංගීත භාණ්ඩ ව්‍යුහකරණාත්මක විද්‍යාව හා Historical Performance Practice මත පදනම්ව පවතී. ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් දත්ත රැස් කිරීම හා නිරීක්ෂණ සිදු කිරීම සිදු කෙරිණි. ඊට අමතරව ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රය ද්විතියික මූලාශ්‍රය මත පදනම්ව පවති. ප්‍රමාණාත්මක ක්‍රමවේදය ඔස්සේ විහාරස්ථානයේ පාදමෙහි මූර්තිමත් කර ඇති කැටයම් මිනුම් ගත කිරීම සිදු කරන අතර සංගීත භාණ්ඩ ඇතුළත් කැටයම් එකිනෙකට මිනුම්ගත කිරීම සිදුකෙරේ.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

උසින් අඟල් 13.18 වන කැටයම් පුවරු දොළහසකින් යුක්ත බවත් ඒවා එකිනෙකට වෙනස් අගයන්ගෙන් යුතු බවත්, එම එකිනෙකට වෙනස් වූ පුවරු වෙන් කිරීම සඳහා ඉහළට මදක් එසවූ ආකාරයට කැටයමක් නිරූපණය කර ඇත.

---

[1] සංගීත පීඨය, සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය
ashinichamodini99@gmail.com

හෝන්බොස්ටල්- සැක්ස් වර්ගීකරණය (HS System) සෑම සංගීත භාණ්ඩ සඳහාම පොදු සංගීත භාණ්ඩ වර්ගීකරණයක් ලෙස වර්තමානයේ සලකනු ලබයි. මෙම වර්ගීකරණයේ දී සංගීත භාණ්ඩ ප්‍රධාන කාණ්ඩ හතරකට බෙදා ඇත. නියම්ගම්පාය විහාරස්ථානයෙහි පාදමේ නිරූපිත මෙම කැටයම් මෙම වර්ගීකරණයට අයත් සංගීත භාණ්ඩ පිළිබඳ දැක්වේ.

- පටලමය වාද්‍ය භාණ්ඩ (Membranophones)- පටලයක් ආධාරයෙන් ප්‍රාථමික ධ්වනිය උත්පාදනය කරන්නා වූ කාණ්ඩය මෙනම් වේ.
- තත් වාද්‍ය භාණ්ඩ (Chordophones)- තතක කම්පනය මඟින් ධ්වනිය උත්පාදනය කරනු ලබන සංගීත භාණ්ඩ මෙම කාණ්ඩයට අයත් වේ.
- සුෂිර වාද්‍ය භාණ්ඩ (Aerophones)- වායු කඳක කම්පනය මඟින් ධ්වනිය උත්පාදනය කරන භාණ්ඩ මෙම කාණ්ඩයට අයත් වේ.
- ඝන වාද්‍ය භාණ්ඩ (Idiophones)

**පටලමය වාද්‍ය භාණ්ඩ**

රූපය 6, රූපය 7, රූපය 8, රූපය 9, රූපය 10, රූපය 11 එකම හැඩයකට සමානකම් කියන බෙර වර්ගයන් ය. මිනුම්ගත කිරීමට අනුව ඒවා දිගින් සුලු සුලු වෙනස්කම් වලට පත් වී ඇති බව පැහැදිලිය. රූපය 8, රූපය 9, රූපය 10 පිළිබඳ සැලකීමේදී නර්තනයේ යෙදෙමින් බෙර වාදනයේ යෙදෙන ආකාරය, සළු විහිදී ඇති ආකාරය දෙස බැලීමේදී පැහැදිලි වේ. ඒ අතරම රූපය 8, රූපය 12, රූපය 13 තරමක් වෙනස් ස්වරූපයක් ගනී. මදක් කෙටි ආකාරයකි. රූපය 6, රූපය 8, රූපය 10 බෙරයට රෙදි කැබැල්ලක් දමා තිබීම අනෙත් ඒවාට වඩා විශේෂ තැනක් ගනී. අඩ නිරුවත් ලෙස මෙම කැටයම් වල වාදකයන්ගේ ඇඳුම් ආයිත්තම් නිර්මාණය කර ඇත. රූපය 12 විශේෂ වාදන අවස්ථාවක් නිරූපණය කරයි. බෙරයේ විරුද්ධ දිශාවට වාදනය කිරීමක් දක්නට ලැබේ. ගඩලාදෙණිය විහාරස්ථානයේ ද මේ හා සමාන කැටයමක් දක්නට ලැබේ. එනම් සමකාලීන වාදන සංස්කෘතිය එමගින් මනාව දක්වයි. රූපය 13, රූපය 14, රූපය 15, රූපය 16 ඒක මුඛ බෙර අතැතිව සිටින ආකාරයට දක්වා ඇත. අත් රබානක ආකාරයට වාදනය කරන බව මිනුම්ගත කිරීමට අනුව නිගමනය කළ හැකිය. රූපය 17 දක්වා ඇති ආකාරයට එය කුඩා ඒක මුඛ රබානක් මුගුරකින් වයන ආකාරයක් දක්නට ලැබේ. රාමු බෙර ලෙසද හැඳින්වේ.

**තත් වාද්‍ය භාණ්ඩ**

රූපය 18 සමාන ආකාරයට වාදන ස්වරූපයෙන් පසුවන යුවලක් දක්නට ලැබේ. වර්තමානයේ ඇති වයලීනයෙහි ආකාරයක් දක්නට ලැබේ. එකිනෙකා පසුපස ගමන් කරන ආකාරයට වාදන විලාශයක් පෙන්නුම් කරයි. ඉදිරිය බලා ගමන් කරයි. රූපය 19 දැක්වෙන්නේ වීනාවක ආකාරයකටය. Long Lute නම් වර්ගයට

ගැනිය හැකිය. වර්තමානයේ සිතාරයට සමාන ආකාරයක් දැක්වේ. එයට හේතුව මිනුම්ගත කිරීමට අනුව වාදන භාණ්ඩය 46°ක ආනතියක් පවතී.

සුෂිර වාද්‍ය භාණ්ඩ

රූපය 20, 21 නලා වාදනකරුවන් ලෙස නිරූපණය වන මොවුන් දෙදෙනා මුහුණින් මුහුණ බලා වාදනය කිරීමක් දක්නට ලැබේ. සමාන අඳුම් වලින් සැරසී සිටින අතර උඩුකය නිර්වස්ත්‍රය. රූපය 22 මෙහිදී හක්ගෙඩියක් වාදනය කරන ස්වරූපයක් නිරූපණය කරයි.

ඝන වාද්‍ය භාණ්ඩ

රූපය 23, රූපය 24, රූපය 25 ආදී වූ ගල් කැටයම් වලින් ඝන වාද්‍ය භාණ්ඩ එකල වාදන සංස්කෘතිය තුළ ඇති බව දැක්විය හැකිය. රූපය 23, රූපය 24 ආදියෙන් නිරූපණය වන්නේ තාලම්පොට වාදනය කරන වාදකයන් ය. වාදන භාණ්ඩය සඳහා රෙදි කැබැල්ලක් ගැටගසා ඇති බව දැක්විය හැකිය. පැත්තට හැරී වාදනය කරන ආකාරයකි. රූපය 25 යන ගල් කැටයම තුළින් දැක්වෙන්නේ සෙලවුම් (Rattes) ලෙස දැක්වෙන ප්‍රාථමික සංගීත භාණ්ඩ වර්ගයකි. අවනද්ධ භාණ්ඩ විකාශයේ ආරම්භක අවධියයි.

නිගමනය

විහාරස්ථානයේ හමුවන්නා වූ සාහිත්‍යමය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් හරහා විහාර පරිශ්‍රයෙහි පුරාවිද්‍යාත්මක, සෞන්දර්යාත්මක, වාස්තු විද්‍යාත්මක, දුර්ලභත්ව, ආවේණික නොයෙකුත් අංගයන් නිරූපණය වන බැව් නිරීක්ෂිතය. පුරාතන මිනිසා සමාජ සංස්කෘතිකාංගයක් ලෙස විවිධ අවස්ථාවන්වලදී සංගීතය උපක්‍රමයක් ලෙස භාවිත කළ බව ප්‍රකට වන බවත් එකළ සංගීත භාණ්ඩ වල හැඩය, වාදන ආකාරය, වාදන කරනවුන්ගේ ශරීර ඉරියව් ඈඳ දක්වා සංගීත භාණ්ඩ වර්ධනීය අවස්ථාවක් බවට පත් වී ඇත. එසේම එම භාණ්ඩ ඉහත ආකාරයට HS වර්ගීකරණයට අනුව වර්ග කළ හැකි බවත් නිගමනය කළ හැකිය.

ආශ්‍රිත මූලාශ්‍රය

ධීරානන්ද, ක. (1965). ***ගම්පොළ යුගය***. කොළඹ.

පියනන්ද, ඒ. (1997). ***ගම්පොළ යුගයේ මූර්ති ශිල්පය***. කොළඹ: සංස්කෘතික අරමුදල

Dehideniya, Isuru. (2021). Types of musical instruments depicted in the stone carvings of the Gadaladeniya temple srilanka, ***Heritage journal of multidiscipilinary studies in Archaeology***.